# නෙස්ලේ සමාගම කිරි කර්මාන්තයට ලබා දෙන දායකත්වය ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමන් අගය කරයි

*කිරි කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් සමාගම සිදු කළ ආයෝජනයන් නිරීක්ෂණය කිරීමට නෙස්ලේ කර්මාන්තශාලාව නරඹයි*

කුරුණෑගල පිහිටි නෙස්ලේ ලංකා කර්මාන්තශාලාව නිරීක්ෂණය කිරීමට පැමිණි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු පී. හැරිසන් මැතිතුමා ශ්‍රී ලාංකීය කිරි කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා නෙස්ලේ ලංකා සමාගම ලබා දී ඇති දායකත්වය පිළිබඳව සුවිශේෂ ඇගයීමක නිරත වූණි.

නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ විශාලතම නැවුම් කිරි මිලදී ගන්නා සමාගමයි. නෙස්ලේ ලංකා සමාගම නෙස්ප්‍රේ, මයිලෝ සහ මිල්ක්මේඩ් වැනි තම නිෂ්පාදන සඳහා යොදාගැනීමට 2015 වර්ෂයේදී දේශීය කිරි ගොවීන් 20,000කට ආසන්න සංඛ්‍යාවකගෙන් මිලදී ගත් නැවුම් කිරි වෙනුවෙන් වැය කරන ලද මුදලෙහි සම්පූර්ණ වටිනාකම රුපියල් බිලියන 3.6 කි. දේශීය අමුද්‍රව්‍ය වැඩි වශයෙන් යොදාගනිමින් ශ්‍රී ලංකාව තුළම නිෂ්පාදන කටයුතු සිදු කිරීම නෙස්ලේ ලංකා සමාගමේ ඉලක්කයයි.

මෙම වර්ෂයේදී නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ කිරි දෙනුන් ගහණයෙන් 22%ක් සිටින උතුරු පළාතේ තම කිරි මිලදී ගැනීමේ ජාලය ව්‍යාප්ත කරමින් සිටින අතර පළාතේ සංවර්ධනයට සහයෝගය ලබා දීමද ඒ හරහා සිදු කෙරේ. එපමණක් නොව ජාත්‍යන්තර වශයෙන් සමාගමේ 150 වැනි සහ දේශීය වශයෙන් 110 වැනි සංවත්සරයන් සැමරීමට සමගාමීව 'කිරි ගොවි දිරිය' වැඩසටහන දියත් කිරීමද සිදු කරන ලදී. මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන අතර නව තාක්ෂණික ප්‍රවණතා සහ විශිෂ්ට භාවිතාවන් මෙන්ම උසස් තත්ත්වයේ කිරි නිපදවීම සඳහා ගොවීන් 3,000කට දැනුම ලබා දෙන පුහුණු සහ සංවර්ධන වැඩසටහන් 150ක් පැවැත්වීමට ඒ යටතේ කටයුතු කෙරේ. මෙම කිරිගොවීන් 150 දෙනෙකු සඳහා ඔවුන්ගේ ව්‍යාපාර සංවර්ධනයට උපකාරී වන කිරි ගව පාලනයට අවශ්‍ය උපකරණ පිරිනමමින් ප්‍රතිලාභ අත්කර දීමද එහිදී සිදු කරයි.

''නෙස්ලේ සමාගම ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය සමග දීර්ඝ කාලීන මෙන්ම දැඩි බැඳීමක් පවත්වා ගනිමින් සිටිනවා. 1980 දශකය ආරම්භයේ සිට නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකා රජය සහ දේශීය ගොවීන් සමග කටයුතු කර ඇත. මෙම ක්ෂේත්‍රයෙහි තම උත්සාහයන් වේගවත් කරමින් සහ සවිබල ගන්වමින් දේශීය කිරි සැපයුම සහ ප්‍රමිතිය ඉහළ නංවනවා පමණක් නොවෙයි, ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයං පෝෂිත කරමින් දේශීය කිරි ගොවීන්ගේ තිරසාර ජීවනෝපාය සංවර්ධනයටද සමාගම දායක වෙනවා. පාරිභෝගිකයින්ට දේශීය නැවුම් කිරි යොදාගනිමින් පුළුල් පරාසයක නිපැයුම් පෙළක් ලබා දීම වෙනුවෙන් නෙස්ලේ ලංකා සමාගම ගන්නා උත්සාහය ඉතාමත් ප්‍රශංසනීය බවත් මතක් කරන්නට මම කැමතියි. දේශීය කිරි කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් නෙස්ලේ ලංකා සමාගම ගන්නා උත්සාහයන්ට රජයේ මැදිහත්වීමෙන් විශාල සහයෝගයක් ලබා දෙනවා.'' යනුවෙන් මෙහිදී අදහස් දක්වමින් ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු පී. හැරිසන් මහතා පැවසීය.

නෙස්ලේ ලංකා සමාගම කිරි ගොවීන් සඳහා කිරි ගවයින්ගේ පෝෂණය සහ අභිජනනය, සත්ව සෞඛ්‍යය සහ ගොවිපොළ කළමනාකරණය වැනි පුළුල් පරාසයක තාක්ෂණික මාතෘකා සහ විශිෂ්ට භාවිතාවන් පිළිබඳව පුහුණු සහ සංවර්ධන වැඩසටහන් වසරින් වසර පවත්වයි. එපමණක් නොව කිරි ගව ගොවිපොළ සංවර්ධනය වෙනුවෙන්

මූල්‍ය සහයෝගය ලබා දෙමින් උසස් ප්‍රමිතියේ ගව පැටවුන් බෝ කිරීම සඳහා කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමටද කටයුතු කරයි. තවද රජය සමග එකමුතුව ජංගම පශු සායන පැවැත්වීමටද නෙස්ලේ ලංකා සමාගම කටයුතු කරයි.

''කෘත්‍රිම සිංචනය ගැන පුහුණුව ලබා දීම සඳහා වැඩිපුර තාක්ෂණ ශිල්පීන්ගේ සහයෝගය ලබා දෙමින් කිරි ගවයින් හොඳින් රැක බලා ගැනීම සඳහා අමතර පශු වෛද්‍යවරුන්ගේ සේවය ලබා දෙමින් නෙස්ලේ කිරි ගොවීන්ගේ සුබසාධනය වැඩිදියුණු කිරීමට අපි නෙස්ලේ ලංකා සමාගමට තව දුරටත් සහයෝගය ලබා දෙනවා.'' යනුවෙන් වැඩිදුරටත් අදහස් දක්වමින් අමාත්‍යවරයා පැවසීය.

මේ පිළිබඳව සිය අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පවසා සිටියාය. ''දේශීය ප්‍රජාව සමග ඇති අපගේ දෑඩි බැඳීම සහ ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳව අපට ඇති ගැඹුරු අවබෝධය නිසා ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය සංවර්ධනය කිරීමට දායක වීම නෙස්ලේ සමාගම හදවතින්ම සිදු කරනවා. ගොවීන්ගේ ජීවනෝපාය සහ කිරි කර්මාන්තය සංවර්ධනය සඳහා අපගේ උත්සාහයන් ධනාත්මකව බලපෑම් කර තිබීම රජයේ ඇගයීමට සහ පිළිගැනීමට ලක්වීම මට විශාල සතුටක් ගෙන දෙනවා. අපි ඔවුන් සමග ඉදිරියටත් සමීපව වැඩකටයුතු කරමින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායකත්වය ලබා දෙන බව කියන්නට කැමතියි.''

නෙස්ලේ ලංකා කර්මාන්තශාලාවේ නිෂ්පාදන ක්‍රියාවලිය, එහි භාවිතා කරනු ලබන අති නවීන තාක්ෂණය සහ දෑඩි තත්ත්ව පාලන ප්‍රමිතීන් පිළිබඳව දැක බලා ගැනීමෙන් පසු, ලෝකය පුරාම ඉහළ කීර්තියක් දිනාගෙන ඇති නෙස්ලේ සමාගම අනුගමනය කරනු ලබන ඉහළ ප්‍රමිතිය සහ ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් පිළිබඳව ගරු අමාත්‍යතුමන් සුවිශේෂ ඇගයීමක යෙදුණි.